② ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2293/07 - 2022 අගෝස්තු මස 15 වැනි සඳුදා - 2022.08.15
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

### 8 වැනි වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මඟින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ (නියමය) ප්‍රකාශයට පත්කර ඇති පරිදි පනතේ 8 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය පහත සඳහන් දෑ ඇතුළත් කරමින් නියමයේ උපලේඛනයේ III වන කොටස ලෙස සංශෝධනය කරනු ලැබේ.

(1) මෙහි සඳහන් උපලේඛනයේ II වන කොටසේ I වන ඡේදයේ සහ 2 වන ඡේදයේ සඳහන් කර ඇති කාල සීමාව සහ ව්‍යවහාර මුදල්වල සීමාව නොතකා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් සහ එසේ තම සන්තකයේ රඳවා තබාගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු

(අ) එම පුද්ගලයාගේ නමින් බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාර ව්‍යවහාර විදේශ මුදල් ගිණුමකට අවස්ථාවෝචිත පරිදි තැන්පත් කිරීම; හෝ

(ආ) බලයලත් වෙළෙන්දෙකුට එකී විදේශ ව්‍යවහාර මුදල් විකිණීම

අදාළ බලයලත් වෙළෙන්දා සෑහීමට පත්වන පරිදි එකී විදේශ ව්‍යවහාර මුදල් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම සම්බන්ධව අවශ්‍ය සාක්ෂි ලබා දීමෙන්, **මේ නියමය බලාත්මක වන දිනයේ සිට මසක (1) පොදු සමාකාලය තුළ දී පමණක් කළ හැකිය.**

(2) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් ඉහත සඳහන් කර ඇති II (1) වන වගන්තියෙහි සඳහන් කරුණු අයුරින් නොව අන් අයුරකින් අත්පත් කරගෙන ඔහුගේ සන්තකයේ තබාගෙන ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, **මේ නියමය බලාත්මක වන දින සිට මසක (1) පොදු සමාකාලය තුළ දී පමණක්** අනිවාර්යයෙන් ම බලයලත් වෙළෙන්දෙකු හට විකිණීම අවශ්‍ය වේ.

(3) පනතේ II වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, මෙම නියෝගයේ සඳහන් කර ඇති විදේශ විනිමය රඳවාගත හැකි කාල සීමාව ඉක්මවමින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු තම සන්තකයේ රඳවා තබාගෙන සිටින සියලුම පුද්ගලයන් විසින් මෙම නියෝගය උල්ලංඝනය කරනු ලැබීමකට එරෙහිව වහාම ක්‍රියාත්මක වීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 15 වැනි දින,
මුදල් අමාත්‍යාංශය.
කොළඹ 01 දී ය.

මේ නියමයේ කාර්යය සඳහා -

''පනත'' යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;
''බලයලත් වෙළෙන්දා'' යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;
''පුද්ගලයා'' යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතුය;
''ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තා'' යන්න සංශෝධිත පරිදි, 2021.02.03 දිනැති අංක 2213/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කොට ඇති, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති නියමය ප්‍රකාර ව ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

EOG 08-0133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.